*සැ. යු.-* 2023.11.03 දින පළ කරන ලද අංක 2357 ගැසට් පත්‍රයේ III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,358 - 2023 නොවැම්බර් මස 10 වැනි සිකුරාදා - 2023.11.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 392 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 393 |


*සැ. යු.* - මගේ සිහින යාපනය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 ඔක්තෝබර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදි.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 දෙසැම්බර් මස 01 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 නොවැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

නැගෙනහිර පළාත් සභාවේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් එන්. විල්වරත්නම් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන උප වගන්තිය යටතේ ජනාධිපති විසින් 1996.08.14 දින ප්‍රදානය කර ඇති අංක ත්‍රි. හර. ප්‍ර. 4442 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 11, වාන් ඇල, කන්තලේ පදිංචි උඩගේ ආරච්චිගේ රොබින් නෝනා වෙත ප්‍රදානය කොට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LD/ KA/36/81 යටතේ 1999.10.22 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍ර උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023 ක් වූ දෙසැම්බර් මස 01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුයි.

**උපලේඛනය**

ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්තලේ පත්තුවේ, පේරාරු ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පේරාරු නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ඉන්සෙට් 139 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 4971 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/0.413 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : (ගොඩ)

| | |
|---|---|
| *උතුරට* | : කැ. අ. 4970, |
| *නැගෙනහිරට* | : කැ. අ. අතුරු පාර, |
| *දකුණට* | : කැ. අ. 4965, |
| *බස්නාහිරට* | : කැ. අ. 4972 |

එන්. විල්වරත්නම්,
ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්),
සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය,
කන්තලේ.

2023 ජූලි මස 26 වැනි දින.

11-190

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

නැගෙනහිර පළාත් සභාවේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලේකම් / (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් එන්. විල්වරත්නම් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන උප වගන්තිය යටතේ ජනාධිපති විසින් 2010.06.10 දින ප්‍රදානය කර ඇති අංක ත්‍රි. ප්‍ර. 8819 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උඩගේ ආරච්චිගේ රොබින් නෝනා පදිංචි අංක 11, වාන් ඇල, කන්තලේ වෙත ප්‍රදානය කොට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LD/ KA/63/107 යටතේ 2010.11.22 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍ර උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023 ක් වූ දෙසැම්බර් මස 01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුයි.

**එකී උපලේඛනය**

ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්තලේ පත්තුවේ, වාන් ඇල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වාන් ඇල නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ත්‍රිකුණාමලය මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 121 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි F. T. P. 02 ඉන්සෙට් 134 අතිරේක අංක 4720 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 1.0484 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : (මඩ)

| | |
|---|---|
| *උතුරට* | : කැ. අ. 4728 සහ 4719, |
| *නැගෙනහිර* | : කැ. අ. 4719 සහ 4731, |
| *දකුණට* | : කැ. අ. 4731 සහ 4727, |
| *බස්නාහිරට* | : කැ. අ. 4727 සහ 4728 ඉන්සෙට් 134 |

එන්. විල්වරත්නම්,
ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්),
සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය,
කන්තලේ.

2023 ජූලි මස 26 වැනි දින.

11-191

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/25940.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය : BD/HE/LND/7/9-2

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බැද්දේගම 85 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බැද්දේගම කණුමුල්තැන්න ගමේ අ. ග. සි. 182 පිඹුරේ කැබලි අංක 208 න් කොටසක් පෙන්වීම සඳහා ඇඳ ඇති අනුරේඛනයේ කැබලි අංක 1 දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 20 පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා විජේකෝන් මුදියන්සේලාගේ මහින්දරත්න මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :

*උතුරට* : රජයේ ඉඩම,
*නැගෙනහිරට* : එස්. එම්. ගුණසේකරගේ ඉඩම,
*දකුණට* : මාර්ග රක්ෂිතය,
*බටහිරට* : රජයේ ඉඩම.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (1995.06.15 සිට 2025.06.14 දක්වා)

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි.

*දඩ මුදල.*- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන්ගුණයකි.

*(ආ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 1995.06.15 සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*මෙහි පහත සඳහන් දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම* බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 154

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/72445.
ඉඩම් කොමසාරිස්ගේ අංකය : HDLC/03/46/06/13

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහළ කුඹුක්වැව ග්‍රාම නිලධාරි වසමේ ඉහළ කුඹුක්වැව ගමේ, අනුරේඛන අංක 0187 හි කැබලි අංක 1, 2, 3 ප්‍රමාණයෙන් අක්කර 20 ක් පමණ වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුත්තක් සඳහා ඩී. පී. එල්. ඇග්‍රො එන්ටර්ප්‍රයිසස් නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :

*උතුරට* : රජයේ ඉඩම,
*නැගෙනහිරට* : රජයේ ඉඩම,

*දකුණට* : රජයේ ඉඩම,
*බටහිරට* : රජයේ ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.10.10 දින සිට වසර 30 ක් ඉදිරියට)

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2023 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ මුදලින් 50% කට නොවැඩි විය යුතුය.

*වාර මුදල* - වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

*දඩ මුදල* - 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වාණිජ වටිනාකමින් 10% ක මුදල.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2023.10.10 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ* ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 නොවැම්බර් මස 01 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 175

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/73440
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්පී/28/04/2/එස්එල්ඔ/43/1838

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 214, වවුනියාව නගරය වවුනියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වවුනියාව ගමේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ F. T. P. 7 පිඹුරේ කැබලි අංක 128 දරන ප්‍රමාණයෙන් රූඩ් 02 පර්චස් 02 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් සමිති කටයුතු සඳහා වවුනියාව දිස්ත්‍රික් සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

*උතුරට* : පාර,
*නැගෙනහිරට* : කැබලි අංක 129,
*දකුණට* : කැබලි අංක 133,
*බටහිරට* : කැබලි අංක 131.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහ. (30) යි (2023.10.10 සිට 2053.10.09) දක්වා

(ආ) *වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2023 වර්ෂයේ සිට ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති යුත්තක් හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.10.10 දින සිට වසර පහක් ගතවන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ* ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එච්. ඒ. තාරුකා මධුශානී,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 ඔක්තෝබර් මස 25 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 215

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/75206
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : PLC/L2/25/7/29

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 171/B , බලගල ග්‍රාම නිලධාරී වසමේ මාටාගොඩ ගමේ මු. පි. ගම්, 2606 දරන පිඹුරෙහි කැබලි අංක 01 නැවත බෙදා වෙන් කර සකසන ලද කැ. සි. අංක 512002 හි කැබලි අංක 09 දරන ප්‍රමාණයෙන් පර්චස් 36 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා අයි. ඩබ්ලිව්. ඩබ්ලිව්. ස්ටීල් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 7 සහ 8, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 7, 8 සහ ප්‍රාදේශීය සභා මාර්ගය, |
| *දකුණට* | : | ගම් 2294 වැනි මූලික පිඹුරේ 41 වැනි බිම් කැබැල්ල සහ ගම් 4288 වැනි මූලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ල, |
| *බටහිරට* | : | ගම් 4288 වැනි මූලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ල. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.10.24 දින සිට වසර 30 ක් ඉදිරියට)

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳ පොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුලත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස් (බස්නාහිර)/ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාල ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදුදී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කරගැනීමට නියමිත කාලසීමාව තුල අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2023.10.24 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදුකුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*(ඒ)* බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් නිවේදනය පළ කල දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.*

කේ. ජී. පී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 නොවැම්බර් මස 01 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 216

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.